ශීර්ෂය 298 - මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 298 - මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුලි 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් නොවන ලැබීම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ලැබීම් රු.110,773ක් හා තැන්පතු ගෙවීම් රු.111,225ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ තැන්පතු ලැබීම් හා ගෙවීම් රු.91,000ක් බැගින් දක්වා තිබීම හේතුවෙන් තැන්පතු ලැබීම් හා ගෙවීම් පිළිවෙළින් රු.19,773ක් හා රු.20,225ක් අඩුවෙන් දක්වා තිබුණි. තවද, ඒසීඒ 4 ආකෘතියේ තැන්පතු ලැබීම් හා ගෙවීම් රු.91,000ක් ඇතුළත් කර නොතිබුණි.	ඉදිරි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදිව සකස් කරමි.	තැන්පතු නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය.

(ආ) පුනරාවර්තන වියදම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
භාණ්ඩාගාර පොත් අනුව, වැටුප් හා වේතන වැය විෂයයට අදාළව වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ විසින් දරන ලද රු.176,414ක වියදම ඒසීඒ 2(ii) ආකෘතියට ඇතුළත් කර නොතිබුණි.	ඉදිරි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදිව සකස් කරමි.	උපදෙස් ප්‍රකාරව නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ සම්බන්ධයෙන් සාමාජික ණය ලේඛනය හා අත්තිකාරම් “බී” ගිණුමේ ශේෂය සමඟ සැසඳීමේදී එකතුව රු.159,290ක වෙනසක් පැවතුණි.	සාමාජික ණය ලේඛනය තුලනය කිරීමේදී සිදුව ඇති අතපසුවීමක් හේතුවෙන් මෙම වෙනස්කම් සිදු වී තිබුණද අත්තිකාරම් “ බී” ගිණුමෙහි එම ශේෂයන් නිවැරදිව දක්වා ඇත. සාමාජික අංක 850 හි ශේෂයේ වෙනසට හේතුව මුද්‍රණයේදී වැරදි පිටපතක් මුද්‍රණය වීමයි.	ගිණුමේ හා ලේඛනවල ණය ශේෂ සැසඳිය යුතුය.
(ii)	උත්සව අත්තිකාරම් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය තුළ ලබා දී තිබූ අත්තිකාරම් මුදල රු.1,070,000ක් වුවද, අත්තිකාරම් “බී” පාලන ගිණුම හා වැය ලෙජරය අනුව රු.1,240,000ක් වූයෙන් රු.170,000ක වෙනසක් පැවතුණි. තවද සමාලෝචිත වර්ෂය තුළ උත්සව අත්තිකාරම් ලබාදී නොතිබූ නිලධාරියෙකුට සාමාජික ණය ලේඛනය තුළ 2024 දෙසැම්බර් 31 දිනට රු.10,000ක ණය ශේෂයක් සටහන් කර තිබුණි. එසේම නිලධාරීන් දෙදෙනෙකුට ගෙවා තිබූ එකතුව රු.20,000ක උත්සව අත්තිකාරම් සාමාජික ණය ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.	නිලධාරීන් 17 දෙනෙකුට ගෙවන ලද උත්සව අත්තිකාරම්, උත්සව අත්තිකාරම් ලේඛනයේ සටහන් කිරීමට අතපසු වී ඇති බව පිළිගනිමි. මෙවැනි අතපසුවීම් ඉදිරියේ දී සිදු නොවීමට වග බලා ගනිමි.	ගිණුමේ, ලේඛනවල හා වැය ලෙජරයේ ශේෂයන් සැසඳිය යුතුය.

(ඈ) තැන්පතු

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල වත්කම් යටතේ දක්වා තිබූ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.47,786,165ක් වූ භාණ්ඩාගාර තැන්පතු වටිනාකම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් ලෙස දක්වා තිබීමෙන් දෙපාර්තමේන්තුවේ වගකීම් වැඩියෙන් දක්වා තිබුණි.	මෙම භාණ්ඩාගාර තැන්පතු වටිනාකම මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන වල වත්කම් යටතේ දැක්වීම නිවැරදිය. දෙපාර්තමේන්තු ගිණුමෙන් මෙම වගකීම ඉවත්කිරීමට ඇති හැකියාව පිළිබඳව උපදෙස් ලබා ගැනීමට කටයුතු කරමි.	සාවද්‍ය සටහන් මූල්‍ය ප්‍රකාශනවල නොගැලපීමට කටයුතු කළ යුතුය.

(ඉ) දේපල පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
එකතුව රු.1,443,652,021ක් වූ දේපල, පිරියත හා උපකරණ දෙපාර්තමේන්තුවේ මෙන්ම මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අරමුදලේ වත්කම් ලෙසද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර දෙපාර්තමේන්තුවේ වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමටත් මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අරමුදලේ වත්කම්, ගිණුම්වලින් ඉවත් කිරීමටත් කටයුතු කර නොතිබුණි.	දෙපාර්තමේන්තු ගිණුමේ දේපළ, පිරියත හා උපකරණ ශේෂය රු.1,443,652,021 බව පිළිගන්නා නමුත් අරමුදල් ගිණුමේ ශේෂය රු.1,478,954,968ක් වේ. එමෙන්ම අරමුදල් ගිණුම උපචිත පදනමට ගිණුම්කරණය සිදුකරන බැවින් ක්ෂය වෙන්කිරීමේ ගිණුමේ ශේෂය රු.641,114,795ක් වන බැවින් ශුද්ධ අගය රු.837,840,173 වේ.	දෙපාර්තමේන්තුවේ හා අරමුදලේ දේපල, පිරියත හා උපකරණ වටිනාකම නිවැරදිව වෙන්කර හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුය.

(ඊ) අත්තිකාරම් ගිණුම් ශේෂ

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ගෙවීම වටිනාකම රු.9,977,119ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එම ශේෂය රු.9,889,816ක් ලෙස දක්වා තිබීමෙන් රු.87,303ක වෙනසක් පැවතුණි.	භාණ්ඩාගාර පොත් මුද්‍රිත වගුව SA 52 අනුව වෙනසක් ඇති බව පිළිගනිමි. නමුත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අප විසින් ශේෂ පිරික්සුමෙහි ශේෂ සැලකිල්ලට ගෙන සකස් කර ඇත.	නිවැරදි වටිනාකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය.

(උ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i) ස්ථාවර වත්කම් ලේඛනය		
මුදල් රෙගුලාසි 502(2) සහ 11 වන පරිශිෂ්ටය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් විධිමත්ව පවත්වා නොගැනීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන අනුව එකතුව රු.1,443,652,021ක් වූ දේපල, පිරියත හා උපකරණ වටිනාකමෙහි නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.	ස්ථාවර වත්කම් ලේඛනයේ ඇති ගැටළුකාරී තත්වය හා එකඟ වෙමි. ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරමි.	වත්කම් වෙන් වෙන්ව හඳුනා ගත හැකි වන පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතුය.

(ii) **නිවාඩු පිළිබඳ ලේඛනය**

ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 ප්‍රකාරව නිවාඩු පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි.	නිවාඩු ලේඛනය යාවත්කාලීන නොවූ අවස්ථාවලදී අදාළ ලෙස ඇගයීම් සිදුකර ඇත.	නිවාඩු ලේඛනය නිවැරදිව හා යාවත්කාලීනව පවත්වා ගත යුතුය.

(ඌ) විගණන සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.47,786,165 ක් වූ භාණ්ඩාගාර තැන්පතු ශේෂය සම්බන්ධයෙන් විස්තරාත්මක උප ලේඛනයක් සහ කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් නොවුණි.	මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ යාවත්කාලීන තොරතුරු නොමැති අතර මහා භාණ්ඩාගාරයෙන් උපදෙස් පැතීමට කටයුතු කරමි.	විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ	මෙතෙක් එලෙස සමාලෝචනයක් සිදු කර නොමැති අතර ඉදිරියේදී සිදුකර විගණනයට පිටපත් ඉදිරිපත් කරමි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.		
(ii)	අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙතද, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය වෙතද දන්වා යවා ඇති නමුත් මෙතෙක් නිසි පිළිතුරක් ලැබී නොමැත.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	**අනුකූල නොවීම**	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය			
(i)	II වැනි පරිච්ඡේදයේ 13.3 වගන්තිය	වැඩ බැලීමේ පත් කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වුවත් 2015 වර්ෂයේ සිට එකම නිලධාරියෙකු පරිපාලන නිලධාරී තනතුරෙහි වැඩ බැලීම සඳහා දිගින් දිගටම පත් කර තිබුණි.	පරිපාලන නිලධාරී තනතුර පුරප්පාඩු වී ඇති බව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇත. නමුත් නිලධාරියකු පත්කර එවා නොමැති වීම හේතුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය අනුව අංක 2310/29 හා 2022.12.14 දිනැති කාර්යපරිපාටික	ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව වැඩබැලීමේ පත්කිරීම් සිදුකළ යුතුය. පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා නිත්‍ය පත්කිරීම් සිදු කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය.

			රීතිවල IX පරිච්ඡේදය අනුගමනය කර, දැනට සිටින සේවකයන්ගෙන් සුදුසු නිලධාරියකු අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියද අනුව පත් කර ඇත. විගණන විමසුම අනුව තවදුරටත් වැඩබැලීමේ පත්වීම් ලබාදීම අත්හිටුවන ලදි.	
(ii)	XII වැනි පරිච්ඡේදයේ 5.1 වගන්තිය හා 8.1 වගන්තිය	වර්ෂයක් තුළ උපරිම වශයෙන් ලබාගත හැකි අනියම් නිවාඩු දින 21 ක් සහ විවේක නිවාඩු දින 24 ක් වුවද, සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 12 දෙනෙකු විසින් එම සීමාව ඉක්මවා දින 1.5 සිට දින 91.5 දක්වා නිවාඩු ලබා ගෙන තිබුණි.	වැටුප් අංක 77, 802, 808, 809, 890, 893, 902, 903, 920 හා 923 යන නිලධාරීන්ගේ ඉකුත් නිවාඩු වලින් මෙම වර්ෂයේ වැඩිපුර ලබා ගෙන ඇති නිවාඩු හිලව් කර ගන්නා බව දන්වමි. වැටුප් අංක 955 හා 52 යන නිලධාරීන්ගේ අයහපත් සෞඛ්‍ය තත්වය මත මෙලෙස වැඩිපුර නිවාඩු ලබා ගෙන ඇති බවත් එම නිලධාරීන්ගේ වෛද්‍ය නිර්දේශයන් ලද පසු අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. වැටුප් අංක 230 නිලධාරිනියගේ 2025 අප්‍රේල් මස වැටුපෙන් අදාළ වැටුප් රහිත දින සඳහා වැටුප් අඩු කර ගෙන ඇති බව දන්වමි.	වර්ෂයකට නියමිත නිවාඩු ප්‍රමාණය ඉක්මවා ලබා ගන්නා නිවාඩු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය.

(iii)	XXIV පරිච්ඡේදයේ 4:2:2, 4:2:4, 4:2:5, 4:3, 4:4, 4:5, 4:6 හා 6:3 වගන්ති	විශ්‍රාමික නිලධාරීන් 05 දෙනෙකුගෙන් හා එක් මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු ණය එකතුව රු.744,966 ක් අයකරගෙන නොතිබුණි.	විශ්‍රාම ගිය නිලධාරීන් 05 දෙනාගෙන් අයවිය යුතු ණය පිළිබඳ නොඉල්ලුම් සහතිකය මඟින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. මිය ගිය නිලධාරියාගේ අදාල ණය ඔහුගේ මරණ පාරිතෝෂිකයෙන් අයකරගෙන ඇති බව 2025.01.23 දින දන්වා ඇත.	ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කර ණය අයකර ගත යුතුය.
(iv)	XXIV පරිච්ඡේදයේ 13.6 වගන්තිය	උත්සව අත්තිකාරම් මුදලක් මාස 12ක කාලපරිච්ඡේදය තුළදී එක් වරක් පමණක් ලබා දිය හැකි වුවද, නිලධාරීන් දෙදෙනෙකු වෙත මාස 12ට අඩු කාලපරිච්ඡේදයක් තුළ නැවත උත්සව අත්තිකාරම් ලබා දී තිබුණි.	නැවත මෙවැනි වැරදි සිදු නොවීමට වග බලා ගන්නා ලෙස විෂය නිලධාරියාට උපදෙස් ලබා දුනිමි.	ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව උත්සව අත්තිකාරම් ලබාදිය යුතුය.
(ආ)	2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 756 (6)	දෙපාර්තමේන්තුවේ අංශ 28 ක සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණිත දිනය වූ 2025 අප්‍රේල් 25 දින වන විටත් ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ක්ෂේත්‍ර නිලධාරීන්ගේ කාර්ය බහුලත්වය මත කඩිනමින් වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත ලබා ගැනීමේ අපහසුතා පවතී.	මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණ පවත්වා වාර්තා ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	1992 ජනවාරි 25 දිනැති අංක 03/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	පෙ.ව 8.30 ත් 9.00 ත් අතර පැමිණෙන නිලධාරියෙකුට ප.ව 4.15 න් පසුව වැඩ කර ප්‍රමාද වූ කාලය ආවරණය කිරීමට ඉඩ දෙනු ලබන අතර පෙ.ව. 9.00 න් පසුව පැමිණෙන නිලධාරීන් අවස්ථානුකූලව කෙටි නිවාඩු හෝ වරු නිවාඩු ලෙස සැලකිය යුතු වුවත් පෙ.ව.9.00 න් පසුව පැමිණෙන නිලධාරීන්ට ද ප්‍රමාද වීම් ආවරණය කිරීමට ඉඩදී තිබුණි.	ප්‍රධාන මාර්ගයෙන් බැහැර මාර්ගයක දෙපාර්තමේන්තුව පිහිටුවා ඇති බැවින් ප්‍රවාහන අපහසුතා පවතී. විකල්ප මාර්ගද නොමැත. එබැවින් පෙ.ව. 9.05 දක්වා පමණක් ප්‍රමාද වී පැමිණීමට අවසර ලබාදී ඇති අතර එම කාලය ආවරණය කළ යුතුව ඇත.	චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. චක්‍රලේඛවලට බැහැරව කටයුතු කරන්නේ නම් ඒ සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය.

(ඇ)	2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	වර්ෂ 05ක් එකම සේවා ස්ථානයෙහි සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩ දීම සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු වුවත් දෙපාර්තමේන්තුව තුළ වර්ෂ 06 සිට වර්ෂ 20 කට වැඩි වර්ෂ ගණනක් සම්පූර්ණ කරන ලද දීප ව්‍යාප්ත සේවාවේ නිලධාරීන් 29 දෙනෙකු සඳහා ස්ථාන මාරු ලබා දීමට කටයුතු කර නොතිබුණි.	දීපව්‍යාප්ත සේවා නිලධාරීන් කිසිවෙකුත් වසර 5කට වැඩි කාලයක් සේවය කර නොමැත.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික ස්ථාන මාරුවීම් ලබා දීමට කටයුතු කළ යුතුය.
(ඉ)	2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 113(6)(ආ) යටතේ අත්තිකාරම් “බී” ගිණුම මඟින් ලබාදුන් ණය හෝ අත්තිකාරම් මුදල් අයකරගැනීමේදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ අංක 01හි (ඉ) ඡේදය	දෙපාර්තමේන්තුවේ වැඩ තහනම් කළ නිලධාරීන් 03 දෙනෙක් හා සේවය හැරගිය නිලධාරීන් දෙදෙනෙකුට අදාළව එකතුව රු.429,176ක් වූ ණය ශේෂ නිරවුල් කිරීම සඳහා කටයුතු කර නොතිබුණු අතර එම ණය ශේෂය තුළ අවුරුදු 14 කට වඩා වැඩි කාලයක සිට පැවත එන රු.119,906ක ණය ශේෂයක්ද පැවතුණි.	මේ සම්බන්ධයෙන් නීතිපතිගෙන් උපදෙස් ඉල්ලා ඇත.	මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූලව ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 රජයේ නිලධාරීන් ඇප තැබීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 880 හා 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ඇප තැබීමට අවශ්‍ය නිලධාරීන් හඳුනාගෙන ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල සාකච්ඡා කිරීමේදී වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අමාත්‍යාංශ ලේකම්තුමා ලබාදුන් උපදෙස් වන්නේ ඇප ලේඛනයක් නොමැති නමුත් නිලධාරීන් විසින් දෛනිකව මුදල් රැස්කිරීම සිදු කරන බැවින් ඇප සුරැකුමක් හෝ රක්ෂණාවරණයක් ලබා ගැනීම සුදුසු බවයි. ඒ අනුව ආදායම් එකතු කරන ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා මාර්ගස්ථ මුදල් රක්ෂණාවරණයක් ලබා ගන්නා ලදි.	ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප ලබාගැනීමට කටයුතු කළ යුතුය.

4.2 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අදාළ විෂයභාර නිලධාරීගේ නොසැලකිලිමත්කම හේතුවෙන් නිලධාරීන් 04 දෙනෙක් අවස්ථා 8 කදී ඉල්ලුම් කර තිබූ එකතුව රු.661,538ක් වූ අග්‍රහාර රක්ෂණ හිමිකම් අයදුම්පත්‍ර සඳහා රක්ෂණ ප්‍රතිලාභ අහිමි වී තිබුණි. මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පැවැත්වීම සඳහා 2024 නොවැම්බර් 06 වන දින ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර තිබුණද විගණිත දිනය වූ 2025 අප්‍රේල් 23 දින වන විටත් එම විමර්ශන කටයුතු අවසන් වී නොතිබුණි.	මේ සම්බන්ධයෙන් විමර්ශන කමිටුව කිහිපවරක් නිර්දේශ ලබා දී ඇති අතර, තවදුරටත් ඒ සම්බන්ධව කමිටුව කටයුතු කරනු ලැබේ. ඒ අනුව මේ සඳහා අවශ්‍ය සාධාරණ විසඳුමකට ඒමට උත්සාහ දරනු ලැබේ.	මූලික විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කළ යුතු අතර අගතියට පත් නිලධාරීන් සම්බන්ධයෙන් හා ඊට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් නිර්දේශ පරිදි ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක (III ශ්‍රේණිය) විසින් රාජකාරී ඉටු කිරීමේදී සිදු කරන ලද අක්‍රමිකතා සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කිරීම සඳහා පුද්ගල කණ්ඩායමක් 2024 ජනවාරි 19 දින පත්කර තිබුණද එකී විමර්ශනය	මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.	විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

	අවසන් නොවීම මත වර්ෂයකට පසු එනම්, 2025 ජනවාරි 10 වන දින නැවතත් ත්‍රිපුද්ගල කමිටුවක් පත් කර තිබුණි.	

5. **යහපාලනය**

5.1 **අභ්‍යන්තර විගණනය**

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ කටයුතු ඉටුකිරීම පිණිස සුදුසු අභ්‍යන්තර විගණකවරයෙකු පත් කළ යුතු වුවද, 2021 සැප්තැම්බර් 06 දිනෙන් පසුව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණි.	2021 සැප්තැම්බර් 06 න් පසු දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන තනතුර පුරාප්පාඩු වී පවතී. මේ සම්බන්ධයෙන් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙතද, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය ද වෙත දන්වා යවා ඇත. මෙතෙක් අභ්‍යන්තර විගණකවරයකු පත් කිරීම සම්බන්ධයෙන් නිසි පිළිතුරක් ලැබී නොමැත.	අභ්‍යන්තර විගණකවරයෙකු කඩිනමින් පත් කර ගැනීමට කටයුතු කළ යුතුය.

6. **මානව සම්පත් කළමනාකරණය**

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත කාර්යමණ්ඩලය 20ක් වුවත් 2011 වර්ෂයේ සිට ඉන් තනතුරු 11ක් පුරප්පාඩුව පැවති අතර එය අනුමත සංඛ්‍යාවෙන් සියයට 55ක ප්‍රතිශතයක් විය. තවද, මේ තුළ සහකාර අධ්‍යක්ෂ (පාලන), අභ්‍යන්තර විගණක, නීති නිලධාරී යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03ක් පුරප්පාඩුව පවතින බැවින් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනය කෙරෙහි එය සෘජුවම බලපාන බවද නිරීක්ෂණය විය.	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ප්‍රමාද දෝෂයන් හේතුවෙන් මෙම තනතුරු පුරප්පාඩුව පවතී. දෙපාර්තමේන්තුව අවශ්‍ය කටයුතු උපරිම ලෙස සිදුකර ඇත.	පුරප්පාඩු තනතුරු පිරවීමට කඩිනමින් කටයුතු කළ යුතුය.

(ආ)	අනුමත තෘතීයික මට්ටමේ තනතුරු 30න් තනතුරු 28ක් එනම් සියයට 93ක් පුරප්පාඩුව පැවතුණි.	සහකාර අධිකාරී තනතුරු 29 සම්බන්ධයෙන් 2015 සිට ගැටළුවක් පවතී. මෙම පුරප්පාඩු පිරවීමට දෙපාර්තමේන්තුව අවශ්‍ය උපරිම මට්ටමෙන් සිදු කර ඇත. ඒ අනුව වත්මන් කාර්යමණ්ඩල සමාලෝචනයට පත්කළ අග්‍රාමාත්‍ය කමිටුව විසින් සහකාර අධිකාරි තනතුරු 13ක් පිරවීම සඳහා අනුමැතිය දී ඇත.	පුරප්පාඩු තනතුරු පිරවීමට කඩිනමින් කටයුතු කළ යුතුය.